# පටුන


| මාතෘකාව | පරිච්ඡේදය | පිටුව |
|---|---|---|
| කොකෝ ඩ්‍රීම්ස් ලංකා පොල් ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රය හැඳින්වීම | 1 | 2 |
| පොල් ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රයේ චිප්ස් ප්‍රමාණය වෙනස් කර ගැනීම | 2 | 3 |
| පිහිතලය පිහි මුවහත් කිරීමේ ගල මගින් මුවහත් කර ගැනීම | 3 | 4 |
| පිහිතලය යන්ත්‍රයට සවි කිරීම | 4 | 5 |
| යන්ත්‍රය නඩත්තු කිරීම පිළිබඳ උපදෙස් | 5 | 6 |
| යන්ත්‍රයෙහි දැල මාරු කිරීමේ ක්‍රමවේදය | 6 | 7 |
| යන්ත්‍රයෙහි සපත්තු කොටස නිවැරදිව සීරුමාරු කිරීම | 7 | 8 |
| යන්ත්‍රය මගින් නිවැරදිව පොල් ලෙලි අල්ලන ක්‍රමය | 8 | 9 |
| මැෂිමට විදුලි බලය ලබා දීම සඳහා උපදෙස් | 9 | 10 |
| යන්ත්‍රය පොළෙවෙහි තැබීම සඳහා උපදෙස් | 10 | 11 |
| ඉවත දමන පොල්ලෙලි පට්ටා කොටස් සල්ලි කරමු | 11 | 11 |
| නිවැරදි ලෙස පොල්ලෙල්ලක් තෝරා ගනිමු | 12 | 12 |
| පොල්ලෙලි කැබලි නිසි ලෙස වියලා ගනිමු | 13 | 13 |
| නිසි පරිදි වියලා ගත් චිප්ස් කැබලි උර කිරීමේ ක්‍රමවේදය | 14 | 14 |
| නිතර අසනු ලබන ප්‍රශ්න | 15 | 16 |


Coco Dreams Lanka ආයතනය වෙතින් පිදෙන පොල්ලෙලි කැබලි කිරීමේ සහ මෙම කර්මාන්තය හා සම්බන්ධ සියලු විස්තර මෙහි අඩංගු වන අතර මෙම මුද්‍රිත පිටපත අප ආයතනයෙන් පොල්ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රයක් මිළදී ගන්නා පාරිභෝගිකයෙකු හට පමණක් නිකුත් කරන අතර මෙහි ඇතුළත් කරුණු කිසියම් හෝ කෙනෙකු හොඳින් අධ්‍යනය කර මෙම කර්මාන්තය ජය ගන්නා අරමුණින් මෙය ඔබ හට තිළිණ කරන්නකි.

# 1

# කොකෝ ඩ්‍රීම්ස් ලංකා පොල් ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රය

අප ආයතනය තුල පොල්ලෙලි කැබලි කිරීමේ යන්ත්‍ර දෙකක් ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය කරන අතර වසර ගණනාවක සිට අප නිෂ්පාදනයන් ලෝකයේ විවිධ රටවල් වෙත අපනයනය කරනු ලබයි.

1. තනි පුද්ගල (Single) යන්ත්‍රය
2. ද්වී පුද්ගල (Double) යන්ත්‍රය

<u>මෙම යන්ත්‍ර දෙකෙහි විශේෂාංගයන් පහත පරිදි වේ.</u>

1. කැපිය හැකි පොල්ලෙලි කැබලි ප්‍රමාණ:
   - 5 mm - 25 mm
2. එක් දිනකට කැපිය හැකි පොල්ලෙලි ගණන:
   - Single :- 2500-3000
   - Double:- 5000-6000
3. යන්ත්‍රයෙහි බර ප්‍රමාණය:
   - Single:- 185kg
   - Double:- 350 kg
4. සැපයුම් විදුලි ප්‍රමාණය:
   - 220v – 240 v / 400v
5. ප්‍රතිධාන ධාරිතාවය:
   - පොල් ලෙලි 3000 කින් වේලුම් බර කිලෝ ග්‍රෑම් 950 - 1000.
6. වර්ණය:
   - ලගූන් බ්ලූ
7. මෝටර් ධාරිතාවය:
   - Single :- 5 HP
   - Double:- 3 HP / 2 HP
8. භාවිත අමුද්‍රව්‍ය:
   - යකඩ, වානේ, ප්ලාස්ටික්


(C) Copyright 2021/08/10 All Rights Reserved

# 2

# පොල් ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රයේ විජ්ස් ප්‍රමාණය වෙනස් කර ගැනීම

අපගේ පොල්ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රය මගින් කැබලි මිලිමීටර 5 සිට 25 පමණ වන තෙක් සීරු මාරු කිරීමෙන් අදාළ විජ්ස් ප්‍රමාණය සකසා ගත හැක.
ඒ සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන්න.

1. පිහිතලයෙහි ඝණකම මැන සටහන් කරගන්න
   - මේ සඳහා ඔබට වර්නියර් කැලිපරයක් භාවිතා කරගැනීමෙන් සිදුවන දෝෂ අවම කරගත හැකිය. කැලිපරයක් නොමැතිනම් ලගම තිබෙන හාර්ඩ්වයාර් එකකකට ගොස් එය මැන ගත හැක.

2. අවශ්‍ය ප්‍රමාණයට වොශර් සකසා ගන්න.
   - මේ සඳහද ඔබ කැලිපරයක් මගින් මිනුම් ගන්නේනම් ඇති විය හැකි දෝෂ අවම කරගත හැක.
   - පලමුව ඔබට අවශ්‍ය වන විජ්ස් ප්‍රමාණය සටහන් කරගන්න.
   - අනතුරුව, ඉහත පළමු පියවරෙහි මැන ගන්නා ලද පිහිතලයෙහි ඝනකම පහතින් සටහන් කරගන්න.
   - ඉන්පසු, අවශ්‍ය විජ්ස් ප්‍රමාණයෙන් පිහිතලෙහි ඝනකම අඩු කරන්න. (සියලුම මිනුම් මිලිමීටර් වලින් ලබා ගන්න)
   - ඉහතදී ලැබුන අගය වොශර් කිහිපයක් යොදා සකසා ගන්න.
   - එලෙසම වොශර් සෙට් 4 ක් සකසා ගන්න.

   සැ.යු. පිහි තල දෙකෙහි ඝණකම් සමානනම් සකසා ගන්නා වොශර් සෙට් හතරෙහිම ඝණකම සමාන විය යුතුය.

උදාහරණයක් ලෙස පිහිතලහෙහි ඝණකම මිලිමීටර 4 ක් ලෙස ගනිමු. කිසියම් හෝ කෙනෙකුට මිලිමීටර 10 ලෙස විජ්ස් ප්‍රමාණය වෙනස් කරගත යුතුව ඇත යැයි උපකල්පනය කරමු.

මෙහිදී අප මුලින්ම කරනුයේ අවශ්‍ය විජ්ස් ප්‍රමාණය සටහන් කර ගැනීමයි. අනතුරුව ඉන් පහලින් පිහිතලයෙහි ඝණකම සටහන් කර ගත යුතු වේ. ඉන්පසු, 10mm වලින් පිහිතලේ ඝණකම වන 4mm අඩු කළ යුතුය.

ඉන්පසු, 6mm ලෙස අගයයක් ලැබෙනු ඇත.
මෙම 6mm සඳහා වොශර් තුනක් හෝ හතරක් තබා මැන ගත යුතුවේ. (එකම වොශර් උනත් විවිධ ඝණකම් සහිත වොශර් තිබිය හැක)

මෙලෙස, 6mm වොශර් සෙට් හතරක් සකසා ගත යුතු වේ.

Coco Dreams Lanka
(C) Copyright 2021/08/10 All Rights Reserved

# 3

# පිහිතලය පිහි මුවහත් කිරීමේ ගල මගින් මුවහත් කර ගැනීම

පිහිතලයක පැති දෙකක් ඇත. එක පැත්තක් ග්‍රයින්ඩර් එකකින් ගාලා පන්නරය තබා ඇති අතර එය පහතට බෑවුම් සහිත ( slope ) වන ලෙස නිර්මාණය කර ඇත. අනෙක් පැත්ත සම්පූර්ණයෙන්ම සමතලා ලෙස (flat ව) පවතී.

පිහිතලය මුවහත් කිරීමට පෙර ඔබ පිහි මුවහත් කිරීමේ ගලක් මිළදී ගත යුතුය. වෙළෙඳපොලෙහි විවිධ ගල් ඇති අතර ඔබ මිළදී ගත යුත්තේ ඇමරි ගල සහිත ගලකි.

මිලෙන් අධික උසස් තත්වයක් ඇති ගලක් භාවිතා කිරීමෙන් ඔබට දීර්ඝ කාලයක් එම ඇමරි ගල තබා ගැනීමට හැකි අතර පිහිය මුවහත් කිරීම සඳහා ගත වන කාලය අඩු වේ.

ඇමරි ගල භාවිතයෙන් පිහිය මුවහත් කිරීමේ ක්‍රියා පිළිවෙල.

1. ඇමරි ගල ලෑලි කෑල්ලකට තබා වටේට ඇණ 4-5 ක් ගසා හෝ වෙනයම් දෙයක් භාවිතා කර ඇමරි ගල රඳවා ගන්න.
2. රඳවාගත් ඇමරි ගලට වතුර හෝ පොල්තෙල් (වඩා හොඳයි) ස්වල්පයක් දමන්න. (පළමුව එය සඳහා පොල් තෙල් ගොඩක් උරා ගනී).
3. පිහියේ බෑවුම් සහිත පැත්ත ඇමරි ගලට තබන්න. පිහියේ කැපුම් පැත්ත ඔබ දෙසට තිබිය යුතු වන අතර රවුම් කර ඇති පැත්ත ඔබෙන් ඉදිරි දෙසට තිබිය යුතු වේ.
4. තරමක හැඩයක් තබාගෙන පිහිය ඔබෙන් ඉදිරි දෙයට පමණක් හොඳින් පිරි මදින්න.
5. යම් කාලයක් පිරිමැදීමෙන් පසු පිහි තලයෙහි අනෙක් පැත්ත වන flat පැත්ත ඇමරි ගලට තබා හැඩ නොකර සුපුරුදු ලෙස ඉතා කෙටි කාලයක් පිරි මදින්න.
සැ.යු. මෙම පැත්ත හැඩ කර ගැමෙන් වළකින්න.

6. රෙදි කැබැල්ලක් ගෙන පිහි තලය හොඳින් පිස දමා යන්ත්‍රයට සවි කරන්න.

මේ සම්බන්ධ වීඩියෝ පටය පහත ලින්ක් එක මගින් ඔබට බලා ගත හැක.

https://youtu.be/ohfSfoTNwnE


(C) Copyright 2021/08/10 All Rights Reserved

# 4 පිහිතලය යන්ත්‍රයට සවි කිරීම

ඉහතදී මුවහත් කරගත් පිහිතල දෙක යන්ත්‍රයට සවි කරන ආකාරය මෙම කොටසින් දැක්වේ. මේ සදහා ඔබ දැනට සපයා ගෙන ඇති  වොශර් සෙට් 4, මුවහත් කරගත් පිහිතල දෙක,  සවි කිරීම සදහා දී ඇති ඇණ, නට් හතර සහ 15,16 යතුරු දෙක ලංකරගන්න.

1. රූපයෙහි පෙනෙන ලෙස උඩ පියන විවෘ ත කරගන්න.
2. අනතුරුව, ලොකු ප්ලේට් එකක් ඔබට දැක ගත හැක. එහි අඩ සඳ ආකාරයෙන් පවතී. එම අඩ සඳ ආකාරයේ කොටස් දෙකක් පවතී. එම කොටස් වලට පිහි තල සවි කළ යුතු ය.
3. පිහිතල දෙකට ඇණ හතර දමන්න. ඇණ දමන විට ඇණේට සවි වී හිස කොටස පිහි තලයෙහි සමතල පැත්තට (Flat) හිටින සේ දැමිය යුතු වේ.
4. ඉන්පසු, පිහි තලයෙහි බැවුම් සහිත දෙසට ඇති ඇණෙහි කඳ කොටස තුළට ඔබ සාදාගත් වොශර් සෙට් එක එක දමන්න.
5. අනතුරුව, ප්ලේට් එකේ අඩ සඳ ආකාරයෙන් පවතින කොටස පිහියේ රවුම ගැලපෙන ලෙස ඇණ දමා තද කරගන්න.
6. මෙලෙස පිහිතල හතරම දමා ඇණ ටික හිර කරගන්න.

සැ.යු. පිහි සවි කිරීමේදී නිවැරදි ලෙස එය ප්‍රවේශමෙන් කරන්න. මෙහි සුලු වැරැද්දක් නිසා පිහි තලය සවි වීමේ පැත්ත මාරු උනහොත් චිප්ස් නියමිත ප්‍රමාණයට නොකැපෙන අතර, කැලි වල ගුණාත්මක බව අඩු වේ.

පිහිතල දෙක නිවැරදිව සවි කළේ නම්, ඔබ පිහිතල සවි කරන පෙදෙස සිට බැලූ විට ඔබට පිහිතල දෙකෙහිම සමතල පැත්ත (Flat) ඔබ සිටින දෙසට යොමු වී ඇත, ඒසේ නොවේනම් එය වැරදි සවි කිරීමකි, නැවත නිවැරදි කර ගැනීම සඳහා අප ආයතනයෙහි තාක්ෂණිකයෙකු හට ඔබට දැනුම් දිය හැක.




(C) Copyright 2021/08/10 All Rights Reserved

# 5

# යන්ත්‍රය නඩත්තු කිරීම පිළිබඳ උපදෙස්

මෙම යන්ත්‍රය නිපදවීම සඳහා අප ඉතා උසස් අමුද්‍රව්‍ය යොදා ගෙන ඇත. එහෙත් පොල්ලෙලි වල තිබෙන ඇසිඩ් එක නිසා යන්ත්‍රයේ දිරීම ඉක්මන් වේ. මෙම දිරීම කිසියම් පාලනයක් කිරීම සඳහා පහත සඳහන් ක්‍රම අනුගමනය කරන්න.

1. මුහුදු බඩ පෙදෙසක මෙම යන්ත්‍රය සවි කරනු ලබයිනම්, යන්ත්‍රය තබා ගන්නා තැන හොඳින් වට කළ යුතුය. ඒ සඳහා ඉටි කොළ හෝ තහඩු භාවිතා කළ හැකිය.
2. යන්ත්‍රයෙහි වැඩ අවසන් වූ පසුව එය හොඳින් පිස දැමිය යුතුය. ඒ සඳහා රෙදි කැබැල්ලක් හෝ පිස්නාවක් යොදා ගත හැකිය. මෙය අනිවාර්‍යය ක්‍රියවක් වන අතර මෙය නිසි ලෙස සිදු කිරීම මගින් දිරීම පාලනය කර ගත හැකිය.
3. දීර්ඝ කාලයක් මෙම යන්ත්‍රය මගින් වැඩ නොකරන්නේ නම් යන්ත්‍රය තුළට ඔයිල් ආලේපනය කරන්න

යන්ත්‍රයෙහි ඇති අනෙක් කොටස් කෙරෙයි අවධානය යොමු කිරීම මගින් යන්ත්‍රයෙහි ආයු කාලය වැඩි කරගත හැක. එම කරුණු වන්නේ,




- ඇණ සහ මුරිච්චි කොටස් හොඳින් තද වී ඇතිද යන්න පරික්ෂා කර බලන්න. එසේ නොමැතිනම් යතුරු භාවිතා කර එම ඇණ හොඳින් තද කරගන්න. (යන්ත්‍රයෙහි ඇණ තද කිරීම සඳහා 15,16,19 යන යතුරු ඔබ සපයා ගන්න.)
- ඔබ ඉහලින් පිහි තල සවි කිරීමේදී යතුරක් හෝ ඇණයක් වැටුනහොත් කටර් පෙට්ටියේ යට ඇති දොර මගින් එය ලබා ගත හැකිය. යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට පෙර යට දැලෙහි මොනවා හෝ රැඳී ඇත්දැයි පරීක්ෂා කළ යුතුය. ඒ සඳහා ද එම දොර උපකාරී වේ.
- බෙයාරින් හොඳින් සිර කර ගත යුතු වන අතර ඒ සඳහා ඇලන් යතුරු භාවිතා කරන්න.
- බෙයාරින් වලට නිසි පරිදි නිසි කාලය තුළදී ග්‍රීස් ගැන්වීම අවශ්‍ය වන අතර ඒ සඳහා ග්‍රීස් විදින යන්ත්‍රයක් ඔබ ලබා ගත යුතුය. (සතියක් සති 3ක් අතර කාල සීමාවක් තුළ ග්‍රීස් ගන්වන්න)


(C) Copyright 2021/08/10 All Rights Reserved

# 6

# යන්ත්‍රයෙහි දැල මාරු කිරීමේ ක්‍රමවේදය

ඔබ දෙවන පරිච්ඡේදය තුළින් පොල්ලෙලි කැබලි වල ප්‍රමාණය වෙනස් කරන ආකාරය පිළිබඳව අධ්‍යනය කරන්නට ඇත. මෙම යන්ත්‍රය මගින් 5mm සිට 25mm දක්වා චිප්ස් කැපිය හැකි අතර ඒ සඳහා ඔබ විවිධ දැල් ලබා ගත යුතුය. උදාහරණයක් ලෙස, 7c හෙවත් 7mm කැබලි ලබා ගැනීම සඳහා ඔබ අමතර දැලක් සහ පුලියක් ලබා ගත යුතුය. එලෙසම 9c,10c,11c.. කැබලි කැපීම සඳහා ඔබ වෙනත් දැලක් ලබා ගත යුතුය. මෙම අමතර කොටස් අප ආයතනය තුළින් ඔබට ලබා ගත හැකිය.

දැලක් මාරු කරන්නේනම් ඔබ පහත ක්‍රම අනුගමනය කරන්න.

1. බෙල්ට් කවර් එක ගලවන්න
2. බෙල්ට් දෙක ගලවන්න.(මෙය සිදු කරනු ලබන්නේ පුලිය මාරු කර ගැනීම සඳහා වේ. ඔබ 9c, 10c කපනවනම් අගල් 8 පුලිය යොදා ගතයුතු වන අතර 7c කැපීම සඳහා අගල් 5 පුලිය සවි කර ගත යුතු වේ.)
3. කටර් පෙට්ටිය වටේ ඇති ඇණ හය ගලවන්න.
4. කටර් පෙට්ටියේ ඇති පියන මෝටරයට විරුද්ධ දෙසින් ගලවන්න.
5. ඉන්පසු ඔබට දැල දැක ගත හැකිය. දැලට අදාළ ඇණ හතරක් ඇත. එම ඇණ හතර මගින් දැල සවි වී ඇත. එම ඇණ හතර ගලවා ඉවත් කරගන්න.
6. අනතුරුව දැල රවුමක් ආකාරයෙන් ඉහළට ඔසවා දැනට දමා ඇති දැල ගලවා ඉවත් කරගන්න.
7. ඔබට අවශ්‍ය දැල ඔබ ඉහත දැල ගැලවූ ආකාරයෙන් නැවත යන්ත්‍රයට සවි කරන්න. ඉන්පසු ඉහත සඳහන් කළ ආකාරයට කටර් පෙට්ටියේ පියන සවි කර ගන්න.
8. චිප්ස් ප්‍රමාණයට අදාළ පුලිය සවි කරගන්න. පුලිය සවි කිරීමෙන් පසුව ඔබ ඒ සඳහා බෙල්ට් එකක් ලබා ගත යුතු ය.
9. බෙල්ට් එක සහ අදාළ පුලිය දැමීමෙන් අනතුරුව බෙල්ට් කවර් එක දමා යන්ත්‍රය සූදානම් කරගන්න.

Coco Dreams Lanka
(C) Copyright 2021/08/10 All Rights Reserved

# 7

## යන්ත්‍රයෙහි සපත්තු කොටස නිවැරදිව සීරුමාරු කිරීම

යන්ත්‍රය තුළ ඇති එක් වැදගත් කොටසක් ලෙස සපත්තුව දැක්විය හැකිය. චිප්ස් වලට ගුණාත්මක බව සහ පොල්ලෙලි පට්ටා අපතේ යන ප්‍රමාණය අවම කර ගැනීමට මෙය උපකාරී වේ. මෙය නිසි ලෙස සීරුමාරු නොකළහොත් චිප්ස් වල ගුණාත්මක බව අඩු වනු ඇත. එම නිසා මෙය ඉතා ප්‍රවේශමෙන් සහ නිවැරදි ලෙස සීරුමාරු කිරීම ඉතා වැදගත් වේ.

සපත්තු කොටස සීරු මාරු කිරීමට පෙර ඉහත 2වන පරිච්ඡේදයට අදාළ චිප්ස් ප්‍රමාණය වෙනස් කර ගැනීමේ ක්‍රමවේදය හොඳින් අධ්‍යනය කර පිහිතලයට අදාළ වොශර් සකසා ගන්න. අනතුරුව, පිහිතල යන්ත්‍රයට සවි කර ගන්න.

සපත්තු කොටස ගැලවීම සඳහා එහි ඇණ 3 ක් ඇත. එම
නට් 3 බුරුල් කරගන්න. එය බුරුල් කර ගැනීම මගින් සපත්තුව ඉදිරියට සහ පසුපසට සීරුමාරු කරගත හැක. ඔබ ඉහත කී පිහිතල වල ෆ්ලැට් පෙදෙස සහ සපත්තු කොටසෙහි ෆ්ලැට් පෙදෙස එනම් පිහිතලය දෙසට ඇති සපත්තුවෙහි කෙළවර (ෆ්ලැට් පෙදෙස) හඳුනා ගන්න.

අවශ්‍ය මිලිමීටර ගණනට සෑදූ පිහිතලයෙහි කෙළවර (ෆ්ලැට් පැත්තේ) සහ සපත්තුවෙහි කෙළවර (ෆ්ලැට් පෙදෙස) ගෑවී නොගෑවී යන ලෙස සපත්තුව සීරු මාරු කරගන්න.
(මෙය කෙස් තුඩක පමණ පරතරයක් තබා ගැනීම අත්‍යාවශ්‍ය වේ)

ඉන්පසු, ලොකු රවුම (ප්ලේට් එක) කරකවා පිහිතල දෙකම එක හා සමානව යනවා දැයි පරික්ෂා කර බලන්න. එසේ නොමැනම් දමා ඇති වොශර් ප්‍රමාණයන් සමානදැයි නැවත පරික්ෂා කර බලන්න.

ඉහත නිවැරදි ලෙස සිදු කරනු ලබන සීරුමාරුව අවසන් වූ පසුව සපත්තුවෙහි ඇති නට් 3 හිර කරගන්න. ඒ සඳහා 15, 16 යතුරු භාවිතා කළ හැක.


(C) Copyright 2021/08/10 All Rights Reserved

# 8 යන්ත්‍රය මගින් නිවැරදිව පොල් ලෙලි අල්ලන ක්‍රමය

කොකෝ ඩ්‍රීම්ස් ලංකා ආයතනයෙහි නිෂ්පාදිත මෙම යන්ත්‍රය මගින් පුහුණු අයෙකුට දිනකට ලෙලි 2500-3000 ක් පමණ කැපිය හැකි වේ.
ඕනෑම ආකාරයේ පොල්ලෙලි (අමු සහ වියළුනු) කැපිය හැකි අතර පොල් ලෙලි ඉරු ලෙස වෙන් කර ගැනීම අනිවාර්‍යය වේ.

**පොල්ලෙලි ඉරුවක් යනු කුමක්ද?**
පොල් ගෙඩියක ලෙල්ලක් ගත් විට එහි කෑලි කොටස් 4ක්, 5ක්, 6ක් පමණ තිබිය හැක. එය පොල් ගෙඩියේ විශාලත්වය සහ පොල් ගෙඩියෙන් ලෙල්ල වෙන කරන පුද්ගලයා මත රඳා පවතී. එවැනි පොල් ලෙල්ලක එක් කොටසක් ඉරුවක් ලෙස හඳුන්වයි.

**පොල්ලෙල්ලෙන් ඉරු වෙන් කරගැනීමේ ක්‍රම මොනවාද?**

මේ සඳහා ප්‍රධාන වශයෙන් ක්‍රම දෙකක් භාවිතා කළ හැකිය.

- යන්ත්‍රයක් මගින් පොල් ලෙලි ඉරු වෙන් කර ගැනීම
- අත් ක්‍රමය මගින් (Manuel) ඉරු වෙන් කර ගැනීම

ඉහත ක්‍රම වලින් වෙන් කරගත් පොල්ලෙලි ඉරු යන්ත්‍රයට දැමීමට අවශ්‍ය වේ. පොල්ලෙලි ඉරුව යන්ත්‍රයෙහි සපත්තුවට තබන විට පොල්ලෙලි ඉරුවෙහි උල කොටස සපත්තුවෙහි මල් ගොට්ට ට තබා තද කළ යුතු ය.

මෙලෙස, තද කිරීමේදී තරමක් වේගයෙන් එය සිදු කළ යුතුය.එලෙස වේගයෙන් තද කළේ නැතිනම් ලැබෙන කැබලි වල විශාලත්වය තරමක් අඩු විය හැක.
තවද, පොල්ලෙලි ඉරුව සපත්තුවට කෙළින් යවන්න. එසේ නැතිනම් ලැබෙන කැබලි හැඩේට කැපෙයි.



පොල් ලෙලි ඉරුවෙහි උල කොටස


(C) Copyright 2021/08/10 All Rights Reserved

# 9

## මැෂිමට විදුලි බලය ලබා දීම සඳහා උපදෙස්

කොකෝ ඩ්‍රීම්ස් ලංකා අප ආයතනය සියලුම යන්ත්‍ර නිෂ්පාදනය කරනු ලබන්නේ ඉතා උසස් ගණයේ අමුද්‍රව්‍ය යොදා ගෙනයි. මෙම යන්ත්‍රය තුළ ඇති එක් වටිනා උපාංගයක් ලෙස එහි මෝටරය හැඳින්විය හැක. අපගේ යන්ත්‍රය සඳහා යොදන මෝටරය වෙළෙඳපොලෙහි ඇති ඉතා උසස් overload switch ඇතුළත් මෝටරයකි.

මෙම මෝටරය නිවසේ භාවිතා වන විදුලියෙන් (domestic currant) ක්‍රියා කරවීමට හැකි අතර විනාඩියට වට 1450 ක් හෙවත් 1450 R.P.M සහිත වේ.

එලෙසම, මෙම මෝටරයට විදුලිය සැපයිමට පහත ක්‍රම අනුගමනය කරන්න.

- නිවසට ලැබෙන විදුලි ප්‍රමාණය ප්‍රමාණවත් දැයි විදුලි කාර්මිකයෙකු ලවා පරික්ෂා කර බලන්න.

- යන්ත්‍රය තබන ස්තානයෙහි සිට නිවසෙහි ඇති Main Switch එක දක්වා ඇති දුර මැන ගන්න. මෝටරය සඳහා ඇම්පියර 20.3 ක කරන්ට් එකක් ගන්නා නිසා ඉහත දුර හා සමාන දුරක් දක්වා වයර් ලබා ගත යුතු වේ. ඔබ ලබා ගත යුත්තේ ඇම්පියර 20, 3 core වයර් එකයි.

- මැෂිමෙහි පිටුපස (පොල්ලෙලි කපන පැත්තේ) තහඩු වලින් පුවරුවක් සකසා ඇත. එම පුවරුවෙහි MCB එකක් (Breaker එකක්) සවි කළ යුතුවේ. මෝටරය සඳහා ඇම්පියර 20.3 ක කරන්ට් එකක් ලබා ගන්නා නිසා ඔබ යොදන මෙම බ්‍රේකරය ඇම්පියර 20 ට වඩා වැඩි විය යුතුය. එනම් ඇම්පියර 32 හො 40, 2 pole breaker එකක් ලබා ගත යුතුය.

- අදාළ වයර් කොටස් සඳහා Flexible යොදන්න.

1. නිවසෙහි සිට මෝටරය දක්වා වයර් ඇද ගන්න.
2. එම වයරය මුලින්ම breaker එක වෙත සම්බන්ධ කරන්න.
3. ඉන්පසු, මෝටරයෙහි ඇති overload switch එක හරහා මෝටරයට විදුලිය ලබා දෙන්න.

සැ.යු. මෝටරයෙහි ඇති Overload Switch එක හරහා මෝටරයට විදුලිය ලබා දීම අනිවාර්ය වේ. එය ආරක්ෂිත ක්‍රියාවලියක් වේ.
Plug top මගින් විදුලිය සැපයීමෙන් වළකින්න.

Coco Dreams Lanka
(C) Copyright 2021/08/10 All Rights Reserved

# 10

# යන්ත්‍රය පොළොවෙහි තැබීම සඳහා උපදෙස්

ඔබ මෙම යන්ත්‍රය තැබීම සඳහා කාමරයක් සකසා ගත යුතු වේ. එලෙසම, යන්ත්‍රය තබන තැන දිග අගල් 34ක්, පළල අගල් 25 ක් සහ උස අගල් 12 ක් වන ලෙස කොන්ක්‍රීට් තට්ටුවක් දැමිය යුතු ය. මෙම කොන්ක්‍රීට් තට්ටුව සමතලා ලෙස දැමිය යුතු ය. මෙම කොන්ක්‍රීට් තට්ටුව දැමීමේ මූලික පරමාර්තය වන්නේ කපන කැබලි එක් තැනකට ගොඩ ගැහෙන එක නැවැත්වීමයි.

යන්ත්‍රයෙහි කකුල් හතරට සම්බන්ධ රවුම් 4ක් ඇත. එම රවුම් හතරෙහි සිදුරු විද ඇත. එම සිදුරු තුළින් අවශ්‍යනම් පමණක් ඇන්කර් බෝල්ට් දමා යන්ත්‍රය සවි කළ හැක. යන්ත්‍රයෙහි දෙදරීම් ගතියක් නොමැති හෙයින් එසේ අන්කර් බෝල්ට් හෝ ඇණ යෙදීම අත්‍යාවශ්‍ය නොවේ.
නමුත්, වැඩි ආරක්ෂාව සඳහා ඇන්කර් බෝල්ට් හෝ ඇණ යොදා යන්ත්‍රය පිහිටුවීම කළ හැකිය.

# 11

# ඉවත දමන පොල්ලෙලි පට්ටා කොටස් සල්ලි කරමු

අප යන්ත්‍රය මගින් පොල් ලෙලි කැපූ විට ඉවත් වන පට්ටා ප්‍රමාණය ඉතා අවම වීම එක් සුවිශේෂතාවයකි. පට්ටා කොටස් යනු පොල්ලෙලි කැපීමෙන් පසුව ඉවත් වන (පොල්ලෙලි කපන පැත්තෙන්) කොටස් පට්ටා ලෙස හඳුන්වයි. මෙම පට්ටා මූලික වශයෙන් ඕකිඩ්, අන්තූරියම් වැනි පැළ සඳහා යෙදීමට ඇතැමුන් මිළදී ගනී. ඔබට මෙම පට්ටා කොටස් ඔවුන්ට විකුණා අමතර ආදායමක් ලබා ගත හැකිය.
එලෙසම ඒවා ඔබගේ ගෙවත්තේ විවිධ පැළෑටි සඳහා යොදා ගැනීමට ද හැකියාව ඇත.


(C) Copyright 2021/08/10 All Rights Reserved

# 12

## නිවැරදි ලෙස පොල්ලෙල්ලක් තෝරා ගනිමු

පොල්ලෙලි කැබලි කිරීමේ කර්මාන්තය ඔබ කිරීමට බලාපොරොත්තුවෙන් සිටීනම් ඔබ අනිවාර්යයෙන් දැනගෙන සිටිය යුතු කරුණක් තමයි හරියටම කොහොමද පොල්ලෙල්ලක් තෝරගනු ලබන්නේ කියා. ඔබට විවිධ වර්ගයේ පොල්ලෙලි දැක ගත හැක. පොල්ලෙලි වර්ග කිහිපයක් ඇත. ඒවානම්,

1. **DC (Desiccated Coconut) පොල්ලෙලි** - මෙම DC පොල්ලෙලි ගැසීම සඳහා යොදා ගනුයේ විශාලත්වයෙන් වැඩි පොල් ගෙඩියි. එම නිසා මෙයින් ලබා ගන්නා පොල්ලෙල්ලද විශාලත්වයෙන් වැඩි අතර පොල්ලෙල්ලෙහි ඝනකම ද වැඩිය. මෙම DC පොල්ලෙලි ගැසීමේදී පොල් මුඩුවද පොල්ලෙල්ලට එකතු වේ. DC පොල්ලෙලි ගැසීම සඳහා අමු පොල්ගෙඩිය දින 20-30 ක් පමණ කාලයක් කොළ තැවීම සඳහා තබා ගැනේ. ඉන්පසු පොල් ගෙඩියෙන් පොල්ලෙල්ල ඉවත් කිරීම සිදු කරයි. මෙලෙස ඉවත් කරගන්නා පොල්ලෙලි මෙම යන්ත්‍රය සඳහා වඩාත් උචිත වේ. නමුත් පොල්ලෙලි ගසන දිනයෙහිම (දවසක් දෙකක් පමණ පරක්කු උනාට ගැටලුවක් නැහැ) මෙම ලෙලි රැගෙන විත් යන්තරයෙන් කැපීම වඩාත් යෝග්‍ය වේ. එයට හේතුව වන්නේ, පොල්ලෙල්ල පොල්ගෙඩියෙන් ඉවත් කරන විට පොල්ලෙල්ල තුල ජලය යම් ප්‍රමාණයක් රැඳී තිබීම නිසා පොල්ලෙල්ල තද බවින් අඩුය. එම නිසා යන්ත්‍රයෙහි පිහිතල වලට කිසිදු හානියක් සිදු නොවේ.එනම් පිහිතල නිතර නිතර පිරිමැදීමට අවශ්‍ය නොවේ. තවද, පොල්ලෙල්ලෙන් ඉරු වෙන් කරගැනීමට ද පහසු වේ.

2. **මාලු පොල්ලෙලි** - පොල් ගෙඩිය අමු ආකාරයෙන් පවතින විට හෝ වියළි ආකාරයෙන් පවතින විට මෙම මාලු පොල් ගැසීම සිදු කරයි. පොල් මුඩුව පොල් ගෙඩියට එකතු වන නිසා (පොල් මුඩුව පොල් ලෙල්ලට එකතු නොවේ) යම් බර ප්‍රමාණයක් DC වලට සාපේක්ෂව අඩු විය හැකිය. නමුත් අමු පොල්ලෙලි කපා වේළීමෙන් පසුව ලැබෙන වේළුම් බර තරමක් වැඩි විය හැකිය. එදිනෙදා ජීවිතයේ පිසීම සඳහා මෙම පොල්ලෙලි යොදාගන්නා නිසා මේවා මාලු පොල් ලෙස හඳුන්වනු ලබයි.

3. **නිවෙස් වල භාවිතා කරන මාලු පොල්ලෙලි-** එදිනෙදා ඉවුම්- පිහුම් කටයුතු සඳහා යොදා ගන්නා විශාල හෝ කුඩා පොල්ලෙලි මෙලෙස හැඳින්විය හැකිය. මෙම පොල්ලෙලි අධික අව්වට නිරාවරණය වී හෝ වැස්සට නිරාවරණය වී තිබිය හැක. අධික අව්වට නිරාවරණය වුවහොත් එම පොල්ලෙලි කර වේ (තද බවින් වැඩි වේ). එම පොල්ලෙලි කැපීම මගින් චිප්ස් වල ගුණාත්මක බව අඩු වන අතර පිහියෙහි මුවහත් බව ඉක්මනින් අඩු වේ. එවිට නිතරම පිහි තල පිරිමැදීමට සිදු වේ. එය ගැටලු සහගත ක්‍රියාවක් බැවින් එය පාලනය කර ගැනීම සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන්න.

Coco Dreams Lanka
(C) Copyright 2021/08/10 All Rights Reserved

**අධික ලෙස අව්වට නිරාවරණය වූ පොල්ලෙලි සඳහා**

1. එම පොල්ලෙලි තුනී ලෙස ගොඩක් ගසන්න
2. ගෙදර ඇති Hourse බටයකින් වතුර ස්වල්ප ප්‍රමාණයක් ඉසින්න
3. වතුර ඉසීමෙන් පසුව, ඉටි රෙදි කැබැල්ලකින් එය වසන්න
4. පැය 3-4 ක ප්‍රමාණයක් එලෙස තබා ඉටි රෙදි කැබැල්ල ඉවත් කරගන්න

මෙලෙස කිරීමෙන් පොල්ලෙල්ලෙහි තද බව අඩු වන අතර ඉරූ වෙන් කර ගැනීමද පහසු කරයි.

**අධික ලෙස වතුරට නිරාවරණය වූ පොල්ලෙලි සඳහා**

කාලයක් තිස්සේ අධික ලෙස ජලය උරා ගත් පොල්ලෙලි යන්ත්‍රය මගින් කැපූ විට පොල්ලෙලි කුඩු ලැබේ. මෙලෙස කුඩු අඩු ප්‍රමාණයක් පැවතීම එතරම් ගැටලුවක් නොවන අතර කුඩු වැඩි වුවහොත් විජ්ස් වලට අදාල ගුණාත්මක බව අඩු වේ. මේ සඳහා පොල්ලෙලි නැවත අවශ්‍ය ප්‍රමාණය දක්වා අව්ව මගින් වියළා කැබලි කළද විජ්ස් වලට අදාළ ගුණාත්මක බව අඩු වේ.

සැ.යු. : පොඩි පොල්ලෙලි එනම්, ඝනකම මිලි. 10 ට පමණ වඩා අඩු පොල්ලෙලි මිළදී ගැනීමේදී ඔබට පාඩුවක් විය හැක. ඔබ නිවෙස් වලින් පොල්ලෙලි ලබා ගන්නේනම් ඔබ ඔවුනට පොල්ලෙලි මුනින් අතට හරවා (පොල්ලෙලි පට්ටා කොටස ඉහළට සිටිනා ලෙස එකින් එක) සෙවනක් ඇති තැනක පිළිවෙලට තබන ලෙස පවසන්න.

එලෙසම, නිවෙස් වලින් ලෙලි ලබා ගෙන එම ලෙලි කැබලි කිරීමෙන් ඔබේ ආදායම ඉහළ නංවා ගත හැක (නිවෙසක පොල්ලෙල්ලක මිළ අඩු නිසා).

සැ.යු. පොල් ලෙලි වල පොල්කටු කැබලි කොටස් තිබිය හැක. ඒ ගැන හොඳින් අවධානය යොමු කරන්න. එසේ කටු කැබලි තිබුණහොත් පිහි තලයට හානි විය හැක.

# 13

# පොල්ලෙලි කැබලි නිසි ලෙස වියලා ගනිමු

ඔබ යන්ත්‍රය මගින් කැබලි කරගත් පොල්ලෙලි විජ්ස් වියළා ගැනීම සඳහා විවිධ ක්‍රම උපයෝගී කරගත හැකිය.

1. කොන්ක්‍රීට් තට්ටුවක් මත වියළීම
2. තාර තට්ටුවක් මත වියළීම
3. ඉටි කොළ මත වියළීම
4. තැනිතලා ගලක වියළීම

මෙම ක්‍රම අතුරින් මූලික වියදම අවම වන්නේ ඉටි කොළ මත වියළීමයි. නමුත්, කොන්ක්‍රීට්, තාර සහ තැනිතලා ගලක වියළීම ඉක්මනින් සිදු වන අතර හොඳින් අව්ව වැටේනම් පැය 3-4 න් පමණ වියළේ.

Coco Dreams Lanka
(C) Copyright 2021/08/10 All Rights Reserved

අවශ්‍ය ප්‍රමාණයට කැබලි කරගත් චිප්ස් ඔබ විකුණන සමාගමට අනුව වියළා ගත යුතුය. එනම් ඔවුන් ලබා දෙන තෙතමන අගයයට (Moisture Value) අනුව වියළා ගත යුතුය. මෙම චිප්ස් වියළා ගැනීමේ කාලය චිප්ස් වල විශාලත්වය, චිප්ස් වියළීමට ගන්නා දෑ (කොන්ක්‍රීට් තට්ටුවක් මත, ඉටි කොළ මත, තාර තට්ටු මත), චිප්ස් කිරීමට කලින් තිබූ පොල්ලෙල්ලේ වියලුම් ගතිය සහ ලබා දෙන උෂ්ණත්වයේ ප්‍රමාණය (හිරු එලියෙහි) මත රඳා පවතී. තාර තට්ටුවක් හෝ කොන්ක්‍රීට් තට්ටුවක් දැමීම මගින් වේළීම ඉක්මන් කරගත හැක. ඉටි කොළ වල වේළීමේදී හදිසියේ වර්ෂාවක් ඇති වුවහොත් ඉටි කොළේ මගින් චිප්ස් ගොඩක් ගසා එම ඉටි කොළෙන්ම එම ගොඩ වසා දැමිය හැක. එය ඔබට ඉතා වාසිදායක ක්‍රමයක් වන අතර කොන්ක්‍රීට් හෝ තාර දමනවා මෙන් මූලික වියදමක් අත්‍යාවශ්‍ය නොවේ.

**මෙම පොල් ලෙලි කැබලිවල තෙතමනය මැන ගැනීම සඳහා ක්‍රම දෙකක් පවතී.**

1. තෙතමනය බලන මීටරයක් (Moisture meter) භාවිතයෙන් තෙතමනය මැන ගැනීම
2. අත්ක්‍රමය (Manuel) භාවිතා කර තෙතමනය ගැන අදහසක් ගැනීම

1. තෙතමනය නිවැරදි ලෙස ගණනය කර ගැනීම සඳහා Moisture Meter එකක් භාවිතා කළ හැකිය. වෙළෙඳපොලෙහි විවිධ වර්ගයේ එනම් ඩිජිටල් සහ ඇනලොග් මීටර් දැක ගත හැකිය.
මෙම මීටර වලින් ඉතා පහසුවෙන් චිප්ස් වල තෙතමනය මැන ගෙන එම චිප්ස් විවිධ ආයතන සඳහා ලබා දිය හැක.

**කොහොමද Moisture Meter එකක් භාවිතයෙන් චිප්ස් වල තෙතමනය මැන ගන්නෙ?**

1. වියලුන චිප්ස් පොහොර උරයකට දමන්න (තද නොකර සිහින්ව දමන්න)
2. විනාඩි 10-20 ක් පමණ කාලයක් කට නොබැඳ සෙවනක එම චිප්ස් උරය තබන්න
3. ඉන්පසු මීටරයෙහි ඇති කූරු දෙක චිප්ස් උරය තුළට ඇන මීටරයෙහි සඳහන් පාඨාංක ලබා ගන්න. (ඇනලොග් මීටරයක්නම් ඊට අදාළ බල්බ් එකක් දිස් වෙනු ඇත)

මෙම moisture අගය කැබලි මිළදී ගන්නා ආයතන අනුව වෙනස් වන අතර බහුතරයක් ආයතන moisture අගය 20න් පල්ලෙහා ගනියි. මෙම moisture meter අගය අඩු වෙන්න වෙන්න වේලුම් ගතිය වැඩි වන අතර චිප්ස් වල බර ප්‍රමාණයද වැඩි වේ. Moisture අගය වැඩි වෙන්න වෙන්න චිප්ස් වල තෙතමනය වැඩි වේ.
තෙතමනය moisture මීටරයක් භාවිතා කර මැන ගැනීමේ එකම වාසිය වන්නේ කැබලි මිළදී ගන්නා ආයතනය ඉල්ලන moisture අගයයට සමාන හෝ තරමක් අඩු වන ලෙස චිප්ස් කැබලි වේලා ගත හැකි වීමයි. එවිට චිප්ස් කැබලි වල බර වැඩි කරගත හැක. නැතහොත් ඔබ අනවශ්‍ය ලෙස කැබලි වැඩිපුර වේලා ගත හොත් කැබලි වල බර අඩු විය හැක.

මෙම moisture අගය කැබලි මිළදී ගන්නා ආයතන අනුව වෙනස් වන අතර බහුතරයක් ආයතන moisture අගය 20න් පල්ලෙහා ගනියි. මෙම moisture meter අගය අඩු වෙන්න වෙන්න වේලුම් ගතිය වැඩි වන අතර චිප්ස් වල බර ප්‍රමාණයද වැඩි වේ. Moisture අගය වැඩි වෙන්න වෙන්න චිප්ස් වල තෙතමනය වැඩි වේ.

**තෙතමනය moisture මීටරයක් භාවිතා කර මැන ගැනීමේ වාසිය කුමක්ද?**

තෙතමනය moisture මීටරයක් භාවිතා කර මැන ගැනීමේ එකම වාසිය වන්නේ කැබලි මිළදී ගන්නා ආයතනය ඉල්ලන moisture අගයයට සමාන හෝ තරමක් අඩු වන ලෙස චිප්ස් කැබලි වේලා ගත හැකි වීමයි. එවිට චිප්ස් කැබලි වල බර වැඩි කරගත හැක. නැතහොත් ඔබ අනවශ්‍ය ලෙස කැබලි වැඩිපුර වේලා ගත හොත් කැබලි වල බර අඩු විය හැක.


(C) Copyright 2021/08/10 All Rights Reserved

ඔබට Moisture Meter එකක් මිළදී ගැනීමට අවශ්‍යනම් අපව සම්බන්ධ කරගන්න.

**2. අත්ක්‍රමය (Manuel) භාවිතා කර තෙතමනය ගැන අදහසක් ගැනීම**

අත භාවිතා කර ඔබට Moisture අගය ගැන අදහසක් ගැනීමට හැක. නමුත් මෙම ක්‍රමය මගින් අවශ්‍ය වේලුම් ප්‍රමාණය නිශ්චිතවම සංඛ්‍යාවක් ලෙස බලා ගැනීමට නොහැක. එම නිසා මෙම ක්‍රමය භාවිතා කිරීම යෝග්‍ය නොවේ.

වියලුම් ගතිය බලා ගැනීම සඳහා ඔබ වේලන ලද චිප්ස් අහුරක් අතට ගන්න. එම අහුර අතින් හොඳින් මිට මොලවා තද කරන්න. ඉන්පසු අත දිගහැරිය විට චිප්ස් ටික විසිරී පවතිනවනම් හොඳින් වේලී ඇත. එලෙස විසිරී නොයයිනම්, එනම් ගුලි ගැසේනම් එම චිප්ස් වල වේලුම් ප්‍රමාණය මදි වේ.

# 14

## නිසි පරිදි වියලා ගත් චිප්ස් කැබලි උර කිරීමේ ක්‍රමවේදය

ඉහත දක්වා ඇති ආකාරයට චිප්ස් කැබලි වියලා ගත් පසු ඒවා උර කිරීම සිදු කළ යුතුවේ. උර කිරීමට පෙර ඉහත දී සඳහන් කළ ආකාරයට තෙතමනය පරික්ෂා කළ යුතු ය. නියමිත තත්වයේ චිප්ස් පවතීනම් පමණක් උර කිරීම සිදු කරන්න.
මේ සඳහා පොහොර උර භාවිතා කළ හැකිය. පොහොර උර ගැනීමේදී තරමක් පරණ උර ලබා ගැනීමෙන් ඔබට මූලික වියදම අවම කරගත හැක. ඔබ අලුත් උර මිළදී ගතහොත් ඔබට කම්පැනි එකෙන් නැවත ලැබෙනුයේ පරණ උර ය.

වියලුන චිප්ස් ගොඩවල් ගසා උර කරගන්න. ඉන්පසු එම චිප්ස් උර වලට පුරවන්න. උර වලට පිර වීමේදී සිහින්ව එය සිදු කරන්න (පොහොර කවර වලට පුරවා තද නොකරන්න. සාමාන්‍යයෙන් උරයකට කිලෝග්‍රෑම් 4-6 ප්‍රමාණයක් අල්ලයි.
උර වලට පුරවා, එම වෙලාවෙහිම ලණු කැබලි වලින් උර වල කටවල් බැදීමෙන් වළකින්න. එම මොහොතෙහිම කටවල් බැන්දොත් රත්වී ඇති චිප්ස් වල ඇති ජල වාෂ්ප නිසා නැවත එම චිප්ස් තෙත් වනු ඇත. ඒ හෙයින්, විනාඩි 25-45 ක පමණ කාලයක් එම උර සෙවනෙහි තබා උරවල කට බැදීම සිදු කරන්න.

චිප්ස් ඇතුළත් මෙම උර වැස්සට නිරාවරණය නොවන ලෙස ගබඩා කරගැනීම ඉතා වැදගත් වේ. මෙලෙස සදා ගත් උර සෑහෙන කාලයක් තබා ගත හැකිය.

Coco Dreams Lanka
(C) Copyright 2021/08/10 All Rights Reserved

# 15

## නිතර අසනු ලබන ප්‍රශ්න

- **"අපි මේ චිප්ස් ලබා දිය යුතු ආයතන මොනවාද? එම ආයතන කොහෙද තිබෙන්නේ?"**

මෙම චිප්ස් ලබා දිය යුතු ආයතන රැසක් ලංකාව තුළ ඇත. එම ආයතන ලංකාව පුරා ඇති ඕනෑම ස්ථානයකට ගොස් කැබලි එකතු සිදු කරයි. අප ප්‍රධාන වශයෙන් ආයතන කිහිපයක් සම්බන්ධ කර දෙනු ලබයි. එම ආයතනවල විස්තර පහතින් දක්වා ඇත.

1. Tropicoir Lanka (PVT) LTD: Hettipola Branch- 077 3184 638
   Tropicoir Lanka (PVT) LTD: Hettipola Branch- 077 3438 721
   Tropicoir Lanka (PVT) LTD: Hettipola Branch- 077 3635 794

   Tropicoir Lanka (PVT) LTD: Ambilipitiya Branch- 076 6528 258

2. Kandewaththa (Katana) Chips Factory: 076 2261 893 / 0717761893 (සම්පත් විජේසේකර මහතා)
   (මුලතිව්, පොළොන්නරුව, අනුරාධපුර, ඇඹිලිපිටිය, කොළඹ අවට, ගාල්ල, මාතර....)

3. Coco Culture (අඟුණකොළපැලැස්ස): 077 2384706
   (අම්පාර, ගාල්ල, මාතර, මොණරාගල, රත්නපුර, ගම්පහ...)

4. Thuselco Holdings (PVT) LTD: 077 2177 885
   (ලංකාවේ ඕනෑම තැනකින් චිප්ස් මිළදී ගනියි.)

5. Dew Coco Chips Company: 071 3141 477
   (නාරම්මල, කුලියාපිටිය, ගිරිඋල්ල, කුරුණෑගල,....)

තවත් ආයතන 100 ක විස්තර ඇතුළත් විද්‍යුත් ගොනුවක් ඇති අතර එය ලබා ගැනීම සඳහා අපව සම්බන්ධ කර මැෂිමට අදාල අනන්‍යතාවය තහවුරු කර එය ලබා ගන්න. එය අපෙන් යන්ත්‍රයක් ඉල්ලුම් කළ අය සඳහා පමණක් ලබා දේ.

- **"මෙම යන්ත්‍රය සඳහා වගකීම් කාලය කොපමණ ද?"**

අප යන්ත්‍රයෙහි සැකිල්ල (Frame) එක සඳහා වසර දෙකක වගකීමක් ඇති අතර අනෙක් කොටස් සඳහා (මෝටරය සහ පිහිතල හැර) වසරක වගකීමක් ඇත.

- **"ඉහත ආයතන වලින් ලබා ගන්නේ කුමන චිප්ස් විශාලත්වයෙන් යුත් චිප්ස් කැබලි ද?"**

එම ආයතන සම්බන්ධ කරගෙන අදාළ චිප්ස් වල ප්‍රමාණය දැන ගත හැක. ඉන්පසු, එයට අදාළ නෙට් එක (දැල) අප නිර්මාණය කර ඔබට ලබා දෙන්නෙමු.

Coco Dreams Lanka
(C) Copyright 2021/08/10 All Rights Reserved